# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1950/41 – 2016 ජනවාරි 20 වැනි බදාදා – 2016.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොතුපිටිය පොලිස් මුරපොළ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, වැඩ බලන ඉඩම් අමාත්‍ය විජේසුන්දර මුදියන්සේලාගේ තිලකරත්න බණ්ඩාර ඒකනායක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුකුළු කෝරළේ උඩපත්තුව සුළු කොට්ඨාසයේ, පොතුපිටිය ගමේ (අ.ග.පි. 936) පිහිටි රත්නපුර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ආර්/කේඑල්ඩබ්ලිව්/2014/778 හා 2014.11.07 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1075ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – පොල්කොරටුව – ප්‍රමාණය: හෙක්. 0.1075

උතුරට: මාර්ගය, මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ වී. ඒ. සමරසිංහ හිමිකම් කියන පොල්කොරටුව; නැගෙනහිරට: වී. ඒ. සමරසිංහ, වී. පියසේන, වී. ජේ. කුමාර සහ ජේ. ජී. කෝදාගොඩ හිමිකම් කියන පොල්කොරටුව; දකුණට: වී. පියසේන, වී. ජේ. කුමාර සහ ජේ. ජී. කෝදාගොඩ හිමිකම් කියන පොල්කොරටුව සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

ටී. බී. ඒකනායක,
ඉඩම් අමාත්‍ය (වැ.බ.).

මගේ අංකය: 4-3/4/2014/එල්ඕ/230.
2015 දෙසැම්බර් මස 08 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 - 144